චක්‍රලේඛ අංක 2010/03 (i)

# මැතිවරණ දෙපාර්තමේන්තුව
# தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය 0112868441 - 3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස්
தேர்தல்கள் ஆணையாளர்
e-mail : comelesl@sltnet.lk
දු.අ தொலைபேசி இல. 0112868444
ෆැක්ස් අංකය தொலை நகல் இல. 0112868445

ගණකාධිකාරී (මුදල්) දු.අ. 0112868449
கணக்காளர் (நிதி) தொ.பே.இல.
ෆැක්ස් අංකය 0112868449
தொலை நகல் இல .

මැතිවරණ මහලේකම් කාර්යාලය
තැ.පෙ 02,
රාජගිරිය. 10107
தேர்தல்கள் செயலகம்
த.பெ.02
இராஜகிரிய. 10107


මගේ අංකය : FE/211/2010
எனது இல :
ඔබේ අංකය :
உமது இல

දිනය : **2010.04.26**
திகதி :

මහ බැංකු අධිපති,
අමාත්‍යාංශ ලේකම්වරුන් / ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යාවස්ථාපිත මණ්ඩලවල
සභාපතිවරුන් වෙත,

## පාර්ලිමේන්තු මැතිවරණය - 2010.04.08
## <u>මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම්</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2010.04.09 දිනැති ගෙවීම් චක්‍රලේඛය හා බැඳේ.

02. උක්ත ඡන්ද විමසීමේ ගෙවීම් සම්බන්ධයෙන් වූ 2010/03 හා 2010.04.09 දිනැති චක්‍රලේඛයේ පහත උප වගන්ති මතු දැක්වෙන ආකාරයට සංශෝධනය කර ඇති බව කාරුණිකව දන්වමි.

6.3. 6.1 හි සඳහන් කාර්යයන් සඳහා හැර අනෙකුත් කාර්යයන් සඳහා තම පෞද්ගලික මෝටර් රථය පාවිච්චි කිරීම වෙනුවෙන් ගෙවීම් කළ යුත්තේ වැටුප අනුව සැතපුම් කුලී හිමි නිලධාරීනට පමණක් වන අතර, ආයතන සංග්‍රහයේ xiv පරිච්ඡේදයේ සියළු නියමයන්ට හා සීමාවන්ට යටත්වය. මෙහි දී එම නිලධාරීන් අතුරින් ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි හා ගණන් කිරීමේ කටයුතුවලට පත්වීම් ලබා දී ඇති සහකාර තේරීම්භාර නිලධාරීන්ට පමණක් තම වාහනය සඳහා රියදුරකු රැගෙන යාමට අවසර දී ඇත. එහෙයින් එවැනි පෞද්ගලික රියදුරන්ට (රජයේ නොවන) දිනකට වැටුප රු. 350.00 ක් හා සංයුක්ත දීමනාව (පැය 12 ක කාලයක් සම්පූර්ණ කර ඇත්නම්) රු. 350.00 බැගින් අදාල දින ගණන සඳහා ගෙවිය හැකිය. මොවුනට නියමිත පැය ගණන සම්පූර්ණ වී ඇත්නම් ආයතන සංග්‍රහයේ xiv 4:4:3 අනුව සංයුක්ත දීමනාවෙන් 25% ක අමතර දීමනාව ද ගෙවිය හැකිය.

මෙම ගෙවීම අදාල රියදුරුට නිලධාරියා විසින් ගෙවා ඔහු විසින් මුදල් ලබාගත් බවට තහවුරු කිරීමේ ලිපියක් ගෙවීම් වවුචරයට අමුණා තැබිය යුතු අතර නිලධාරියා ස්ථිර වශයෙන් සේවය කරන කාර්යාලයෙන් මෙම ගෙවීම ලබා ගෙන ප්‍රතිපූර්ණය සඳහා “ඒ ආකෘතිය" මගින් මවෙත ඉදිරිපත් කළ යුතුය.

මෙම දීමනාව සටහන් කිරීම සඳහා "ඒ" ආකෘතියේ වෙනම තීරුවක් වෙන් කර නොමැති හෙයින් එහි අංක (01) තීරුවේ ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරි/ ගණන් කිරීමේ සහකාර තේරීම්භාර නිලධාරි වරයාගේ නම ඉදිරියෙන් (09) තීරුවේ කා.කා.ස දීමනාව යටතේ රියදුරු දීමනාව යනුවෙන් සඳහන් කර ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් කළ යුතුය.

03. 2010.04.20 දින පැවැති මහනුවර හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල නැවත ඡන්ද විමසීමේ රාජකාරි කටයුතු සඳහා මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවීම් ද ඉහත සංශෝධන ඇතුලත්ව 2010/03 හා 2010.04.09 දිනැති පාර්ලිමේන්තු මැතිවරණ ගෙවීම් චක්‍රලේඛයේ උපදෙස් පරිදි සිදු කළ යුතුය.

දයානන්ද දිසානායක
මැතිවරණ කොමසාරිස්.